**ශ්‍රී ලංකා යූත් සර්විසස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගම 2022/2023**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය වියාචනය

ශ්‍රී ලංකා යූත් සර්විසස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගමේ (“සමාගම”) 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මාගේ වාර්තාවේ මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන්, මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.2 මතය වියාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කර ඇති පරිදි, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුළත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මගින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට නොහැකි විය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගම අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගම මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගම වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව සමාගම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම පිළිබඳ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 36 හි 09 ඡේදය අනුව එක් එක් වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසානයේදී වත්කම් සම්බන්ධයෙන් හානිකරණ තක්සේරුවක් සිදුකර අවශ්‍ය ප්‍රතිපාදන ගිණුම්වල ගැලපිය යුතු වුවද, සමාගමේ පවතින රු.68,730,649ක වටිනාකමින් යුතු අවුරුදු 05ට වැඩි වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ සඳහා වාර්ෂික හානිකරණ තක්සේරුවක් සිදුකර අවශ්‍ය ප්‍රතිපාදන ගිණුම්වල ගලපා නොතිබුණි. | 2024/2025 මූල්‍ය වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයට අනුකූලව ගිණුම් සකස් කිරීම සඳහා කටයුතු සිදු කෙරේ. | ප්‍රමිතය පරිදි ලැබිය යුතු ණයගැති ශේෂ සඳහා හානිකරණ තක්සේරුවක් සිදුකර අදාළ ගැලපීම සිදුකළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයේදී රු.2,778,140ක අතැති මුදල් ශේෂ දක්වා තිබුණද, එම මුදල භෞතිකව නොතිබීම හේතුවෙන් මුදල් ශේෂය එම වටිනාකමින් අධිගණනය වී තිබුණි. එම අතැති මුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේදී මුදල් හා මුදල් සමාන දෑ ලෙස දක්වා තිබීම හේතුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදි නොවන බව විගණනයට නිරීක්ෂණය විය. | ඉදිරියේදී නිවැරදි කිරීමට අපේක්ෂා කෙරේ. | මූල්‍ය ප්‍රකාශනවල වූ තොරතුරු ඇතුලත් එම තොරතුරුවල සම්පූර්ණත්වය, නිවැරදිතාවය, පැවැත්ම, අයිතිය ආදී කරුණු තහවුරු කරගත යුතු වේ. වංචාවක් සිදුවී ඇත්නම් ඒ සම්බන්ධයෙන් අදාළ පරීක්ෂණ පවත්වා විනයානුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී රඳවා ගත් ඉපයීම් සඳහා රු.1,413,305ක් පෙර වර්ෂ සඳහා ගලපා තිබුණද, ඒ | 2023/2024 මූල්‍ය ප්‍රකාශන තුළින් මේ සම්බන්ධයෙන් හෙළිදරව් | පෙර වර්ෂයේ සිදුකරන ලද ගැලපීම්වල තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීමට |

| | | | |
|---|---|---|---|
| | පිළිබඳව තොරතුරු විගණනය වෙත ඉදිරිපත් නොවීම හේතුවෙන් එම ගැලපීම්වල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය. | කිරීම් සිදු කර ඇති බව. | කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාගමේ ආපනශාලාවෙන් ලද රු.1,489,015ක් අත ඉතිරි මුදල් ලෙස දැක්වීම වෙනුවට අනෙකුත් ලැබිය යුතු දෑ ලෙස දැක්වීම හේතුවෙන් මුදල් හා මුදල් සමාන දෑ එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද අනෙකුත් ලැබිය යුතු දෑ වැඩියෙන්ද දක්වා තිබුණි. | ඉදිරි මූල්‍ය වර්ෂයේ දී මෙය නිවැරදි කිරීමට පියවර ගන්නා බව. | ගණුදෙණු හා ශේෂ නිවැරදිව ගිණුම් තැබිය යුතු අතර, නිවැරදි තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් සකස් කළ යුතු වේ. |
| (ඈ) | 2023 මාර්තු 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල සඳහන් රු.160,680,916ක්වූ වෙළඳ ණයගැති ශේෂයෙන් රු.155,202,056ක ශේෂයක් එනම් සියයට 97ක් සමාගමේ අංශ අතර නිරවුල් නොවූ ශේෂයන් වුවද, ඒවා සන්සන්දනය කර නිවැරදි කිරීමට සමාගම කටයුතු කර නොතිබුණි. එම ශේෂයන් සම්බන්ධව ප්‍රමාණවත් තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් එහි පැවැත්ම තහවුරු කර ගැනීමට ද විගණනයට නොහැකි විය. | මෙම ශේෂයන් ඇති වූ ආකාරය පිළිබඳ සොයා බැලීම් කර නිවැරදි කිරීමට කටයුතු කෙරේ. | අංශ අතර අන්තර් ශේෂ සෑම වර්ෂයක් අවසානයේම තුලනය කළ යුතුය. |

**1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| | විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | | |
| (අ) | ජාතික තරුණ සේවා සභාවෙන් ලැබිය යුතු දෑ | 203,915,759 | 202,069,519 | 1,846,240 | 2024/2025 මූල්‍ය වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයට අනුකූලව ගිණුම් සකස් කිරීම සඳහා කටයුතු සිදු කෙරේ. | වෙනසට හේතු හඳුනාගෙන එය නොපමාව නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (ආ) | ජාතික තරුණ සේවා සභාවට ගෙවිය යුතු දෑ | 1,341,156 | නැත. | 1,341,156 | ඉදිරි මූල්‍ය වර්ෂයේදී මෙය නිවැරදි කිරීමට පියවර ගැනේ. | නිවැරදි ණයහිමි ශේෂ හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල රු.මි | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| දේපල, පිරියත හා උපකරණ | 2 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා | 2023/2024 මූල්‍ය වර්ෂයට අදාළව ශේෂ තහවුරු කිරීම් සඳහා වන සාක්ෂි ඉදිරිපත් කිරීම සඳහා ඉදිරියේ දී කටයුතු සිදු කෙරේ. | අවශ්‍ය ලිඛිත සාක්ෂි කඩිනමින් ඉදිරිපත් කළ යුතුය. |
| තොග | 1.7 | තොග සමීක්ෂණ වාර්තා | | |
| වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු වටිනාකම | 41.3 | ශේෂ සනාථකිරීම්, උපලේඛණ සහ වෙනත් සාක්ෂි | | |
| වෙළෙඳ ණයහිමි සහ අනෙකුත් ගෙවිය යුතු වටිනාකම | 32.8 | උපලේඛණ සහ ශේෂ සනාථකිරීම් | | |
| ගණුදෙණු හා සිද්ධීන් | 86.7 | අදාළ ජර්නල් සටහන්වල නිරවද්‍යතාවය තහවුරු කිරීම සඳහා අවශ්‍ය සාක්ෂි | | |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ගෙවිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂ 09ක් තිස්සේ පවතින රු.28,395,326 ක්වූ වෙනත් ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට සහ වර්ෂ 08ක කාලයක සිට පවතින රු.35,608,200ක්වූ වෙනත් ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට සමාගම විසින් කටයුතු කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දිගු කාලීනව පවත්නා මුදල සම්බන්ධයෙන් සොයාබලා එය නිවැරදි කිරීමට කටයුතු කෙරේ. | අධික කාලයක් තුළ පවතින ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයේදී පැවති රු.29,931,673 ක වෙළඳ ණය | මෙම ශේෂයන් දිගු කාලයක් තිස්සේ නිරවුල් නොකිරීම | අධික කාලයක් තුළ පවතින ගෙවිය යුතු ශේෂ නිරවුල් |

| | | |
|---|---|---|
| හිමි ශේෂයන්හි ඇතුළත් රු. 13,435,657ක ශේෂය වසර 01ත් 09 ත් අතර නිරවුල් කිරීමකින් තොරව පැවතුණු අතර, මෙම ශේෂ නිරවුල් කිරීමේ ක්‍රියාමාර්ගද ඉතා දුර්වල මට්ටමක පැවතුණි. | සම්බන්ධයෙන් සොයා බැලීම කර නිවැරදි කිරීමට කටයුතු කෙරේ. | කිරීමට කටයුතු කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වා දුන් රජය සතු ව්‍යාපාර සඳහා වන යහපාලනය පිළිබඳ මෙහෙයුම් අත්පොත හා මාර්ගෝපදේශ සංග්‍රහය | | | |
| (i) | මාර්ගෝපදේශයේ 2.3 ඡේදය | උපායමාර්ගික සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම හා වාර්ෂික අයවැය පිළියෙල කොට රේඛීය අමාත්‍යාංශ ලේකම් හරහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත හෝ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2026/2028 සඳහා උපායමාර්ගික සැලැස්ම සකස් කර ඇති අතර, ඊට අනුකූලව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර රේඛීය අමාත්‍යාංශය වෙත යොමු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. | චක්‍රලේඛවලට අනුගත වී උපායමාර්ගික සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කර අනුමත කරවා ගත යුතුය. |
| (ii) | මෙහෙයුම් අත්පොතෙහි 2.3 ඡේදය | සමාගම විසින් පරිපාලන හා මූල්‍ය අත්පොත් සකස් කර, ඒවා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරගත යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. | 2026 වර්ෂයට අදාළ මූල්‍ය බලතල පැවරීම සඳහා පැවරීම් සකස් කර අදාළ අනුමැතිය 2026.03.31 පැවති අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් අනුමැතිය ලබා දෙන ලදී. | සමාගමට අදාළවන පරිදි පරිපාලන හා මූල්‍ය ක්‍රමවේදයක් සකස් කර අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබාගත යුතුය. |
| (ආ) | 2010 දෙසැම්බර් 14 දිනැති අංක PED 55 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | විගණන කමිටු රැස්වීම් සඳහා අදාළ නීති ප්‍රකාරව භාණ්ඩාගාර නියෝජිතයෙකු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස පත් | ජාතික තරුණ සේවා සභාවට අනුබද්ධිත රාජ්‍ය සමාගමක් ලෙස කටයුතු කළ ද රාජ්‍ය කළමනාකරණ සේවා | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සඳහා චක්‍රලේඛයේ සඳහන් නියෝජන |

| | | |
|---|---|---|
| කිරීම සඳහා ව්‍යවස්ථාමය විධිවිධාන නොමැති නම්, භාණ්ඩාගාරයෙන් නියෝජිතයෙකු නිරීක්ෂකයෙකු (Observer) ලෙස පත් කළ යුතු වුවද, සමාගමේ විගණන කමිටුවට භාණ්ඩාගාර නියෝජිතයෙකු පත් කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි වී නොමැති බැවින් ඒ සඳහා වන ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | අවශ්‍යතා සපුරා ලිය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 16.55ක ලාභයක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.මිලියන 15.52ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 1.03ක වර්ධනයක් නිරීක්ෂණය විය. පෙර වර්ෂයට සාපේක්ෂව පාඨමාලා ආදායම සියයට 104කින් වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් විෂයන්, ඉකුත් වර්ෂය සමග සසඳා වැඩිවීම් හෝ අඩුවීම්වල අගයන් එකී ප්‍රතිශතයන් සමග පහත දක්වා ඇත.

| | 2023 | 2022 | වෙනස {වාසිදායක/ අවාසිදායක} | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | % |
| <u>ආදායම</u> | | | | |
| ආරක්ෂක සේවා | 115.80 | 102.38 | 13.42 | 13 |
| පවිත්‍රතා සේවා | 27.24 | 22.36 | 4.88 | 22 |
| ආපනශාලා ආදායම් | 23.66 | 35.03 | (11.37) | (32) |
| මුද්‍රණාල ආදායම් | 2.63 | 7.07 | (4.45) | (63) |
| පාඨමාලා ආදායම් | 36.93 | 18.10 | 18.83 | 104 |
| වෙනත් | 0 | 13.38 | (13.38) | (100) |
| <u>වියදම</u> | | | | |
| ආරක්ෂක සේවා | 111.01 | 86.01 | (25.01) | (29) |
| පවිත්‍රතා සේවා | 23.64 | 17.75 | (5.89) | (33) |
| ආපනශාලා වියදම් | 35.36 | 40.35 | 4.99 | 12 |
| මුද්‍රණාල වියදම් | 5.37 | 9.43 | 4.06 | 43 |
| පාඨමාලා වියදම් | 14.15 | 10.75 | (3.40) | (31) |
| වෙනත් | 0.47 | 18.60 | 18.13 | 97 |

පෙර වර්ෂය තුලදී හඳුන්වා දුන් පාඨමාලාවලින් ලද ආදායම රු.මිලියන 18.83කින් හෝ සියයට 104කින් වැඩිවීම තුළින් ආදායම් ඉහළ නංවාගෙන තිබුණද, සමාගම පිහිටුවන ලද අරමුණුගත කාර්යයන් වන ආපනශාලා සහ මුද්‍රණාලයෙන් ආදායම් උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

විගණනය වෙත ලබාදී ඇති තොරතුරු හා මූල්‍ය ප්‍රකාශන අනුව පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සමාගමේ ලාභ අනුපාත සියල්ල ධන අගයක් ගෙන තිබූ අතර, පෙර වර්ෂය සමග සසඳා එම අනුපාත සැසඳීම පහත දැක්වේ.

| ලාභ අනුපාත | 2022/ 2023 වර්ෂය (ප්‍රතිශතය) | 2021/2022 වර්ෂය (ප්‍රතිශතය) |
|---|---|---|
| ශුද්ධ ලාභ අනුපාතය | 7.37 | 6.86 |
| දළ ලාභ අනුපාතය | 86.61 | 78.19 |
| වත්කම් ප්‍රතිලාභ අනුපාතය | 7.14 | 6.78 |
| ප්‍රාග්ධන ප්‍රතිලාභ අනුපාතය | 14.77 | 16.26 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාගමේ දළ ලාභ අනුපාතය සියයට 80ක සාමාන්‍ය මට්ටමක පැවතුණද, ආරක්ෂක සේවා වියදම සියයට 21කින් හා හා පවිත්‍රතා සේවා වියදම සියයට 33කින් වැඩිවීම හේතුවෙන් ශුද්ධ ලාභ අනුපාතය සියයට 7ක මට්ටමක් ගැනීමෙන් දළ ලාභ අනුපාතය වැඩිවීම තුළින් නිසි ප්‍රතිඵලයක් ලබා ගැනීමට සමාගම අපොහොසත් වී තිබුණි.

(ආ) සමාගමේ පවතින නිෂ්කාර්ය වත්කම් ඵලදායීව උපයෝජනය කර ගනිමින් වත්කම් ප්‍රතිලාභ අනුපාතය ඉහළ නංවා ගැනීම කෙරෙහි කළමනාකරණය මේ දක්වා අවධානය යොමු කර නොතිබුණි.

(ඇ) සමාගම සඳහා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි උපායමාර්ග සැලැස්මක් (Strategic Plan) හා මෙහෙයුම් සැලැස්මක් ( Business Plan) නොතිබීම ලාභ අනුපාත පහළ මට්ටමක පැවතීමට හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පෙර වර්ෂයේදී උපකරණ මිලදීගැනීම සඳහා ලබාදුන් රු.3,741,584ක අත්තිකාරම් මුදල වෙනුවෙන් භාණ්ඩ සපයා නොතිබුණද, මෙම ගණුදෙනුවට අදාල වගකිවයුතු පුද්ගලයන් හඳුනාගෙන ඔවුන්ගෙන් මෙම මුදල අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් සොයා බැලීම් සිදු කරමින් පවතී. ඉදිරියේ දී අවශ්‍ය නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමට අපේක්ෂා කෙරේ. | වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන සිදුවී ඇති අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1982 සැප්තැම්බර් 16 දිනැති අංක 331 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ස්වයං රැකියා මාර්ග සැලසීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම පිණිස අවශ්‍ය මුදල් සපයා ගැනීම සහ තරුණයින්ට විදේශ රැකියා අවස්ථා සලසාදීම මෙම සමාගම පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වන අතර, එම අරමුණ ඉටුකර ගැනීම සඳහා ජපන් භාෂා හා නිපුනතා පුහුණුව ලබා දීමේ වැඩසටහන 2021/2022 සිට 2022/2023 මූල්‍ය වර්ෂය දක්වා පවත්වා රු.36,929,000ක ආදායමක් උපයා තිබුණද, 2023/2024 මූල්‍ය වර්ෂයේ සිට මෙම පාඨමාලා අත්හිටුවා තිබුණි. | 2021/2022 මූල්‍ය වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලද ජපන් භාෂා නිපුණතා පුහුණු පාඨමාලාව එවකට පැවති යම් යම් ගැටළු මත එය නිවැරදි භාවයෙන් යුතුව පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය මත අත්හිටුවීම සිදු කරන ලදී | ආයතනයේ ප්‍රධාන අරමුණ ඉටුකර ගැනීමට අදාළ වැඩපිළිවෙල සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල තනතුරු 05 න් 03 ක් පුරප්පාඩුව පවතින අතර, ඒවා විශේෂ දැනුම සහ පළපුරුද්ද ඇති විශේෂඥයින්ගෙන් පිරවීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. තවද, ස්ථිර පදනමින් සමාගම සඳහා ගණකාධිකාරීවරයකු පත්කර ගැනීමට 2013 වර්ෂයේ සිට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | කඩිනමින් කාර්ය මණ්ඩලය හා අධ්‍යක්ෂ මණ්ඩල පුරප්පාඩු පිරවිය යුතුය. |
| (ආ) 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වා දුන් රජය සතු ව්‍යාපාර සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 3.1 ඡේදය ප්‍රකාරව කාර්යමණ්ඩලය (cadre) සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | සමාගමේ අවශ්‍යතාවය නව බඳවා ගැනීම් සහ සේවක මණ්ඩල සංශෝධනයන් සිදු කර ඒ සඳහා වන ඉදිරි අනුමැතීන් ලබා ගැනීමට අපේක්ෂා කෙරේ. | කාර්ය මණ්ඩලය සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනත හා 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් ප්‍රකාශිත මෙහෙයුම් අත්පොතෙහි 6.6 ඡේදය ප්‍රකාරව රාජ්‍ය සමාගම්වල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාගම විසින් 2022/2023 ගිණුම් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2025 දෙසැම්බර් 19 එනම්, අවුරුදු 02 මාස 06ක ප්‍රමාදයකින් පසුව ඉදිරිපත් කර තිබුණි. | 2025/2026 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ දී මෙම තත්ත්වය මඟහරවා ගැනීමට අපේක්ෂා කෙරේ. | නියමිත කාල සීමාව තුළ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |

## 5. වෙනත් කරුණු

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) 2025 පෙබරවාරි 18 හා 20 දිනවලදී සහ 2025 මාර්තු 19 දින පැවති පිළිවෙළින් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ (COPE) හා එම කාරක සභාවේ අනු කමිටු සාකච්ඡා සටහන් අනුව ඉටුකළ යුතු පහත සඳහන් කමිටු නිර්දේශ මෙම වාර්තාවේ දිනය දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි. | | |
| • සමාගමේ ඉදිරි පැවැත්ම පිළිබඳ පසු විපරම් සිදුකර එහි පැවැත්මෙහි අවශ්‍යතාවය හා එය ජාතික තරුණ සේවා සභාව යටතේ ක්‍රියාත්මක වීමේ අවශ්‍යතාවය පිළිබඳව හා සමාගමේ ව්‍යවස්ථාවලියේ සඳහන් වන මූලික අරමුණු ඉටුවන පරිදි අවශ්‍ය ක්‍රියාමර්ග ගැනීම. | සමාගමේ ඉදිරි පැවැත්ම පිළිබඳව සලකා බැලීම් සිදු කර උපාය මාර්ගික සැලැස්මක් සකස් කර මේ වන විට නව ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා වන ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ තීරණ අනුව කටයුතු කළ යුතුය |
| • සමාගම පිහිටවූ 1981 වර්ෂයේ සිට වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම. | වාර්ෂික වාර්තා සකස් කිරීමේ ආරම්භක පියවරක් ලෙස 2020/2021 හා 2021/2022 | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ තීරණ අනුව කටයුතු කළ යුතුය |

| | | |
|---|---|---|
| | වාර්ෂික වාර්තා සකස් කර පාර්ලිමේන්තුව වෙත යොමු කිරීමට කටයුතු සිදු කරමින් පවතී. | |
| • රජයේ ප්‍රතිපත්ති පිළිබඳව සැළකිලිමත් වෙමින් යාවත්කාලීන සංයුක්ත සැලැස්මක් සකස් කර මාස 03 ක් ඇතුළත අනු කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම. | මේ වන විට සංයුක්ත සැලැස්මක් සකස් කර ඇති අතර, අනුකාරක සභාව වෙත යොමු කිරීම සඳහා පියවර ගනිමින් පවතී. | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ තීරණ අනුව කටයුතු කළ යුතුය |